3 වන පිටෙන්

ඇතැම් මානසික අසමබරතාවෙන් (ආතතියෙන්) පෙළෙන අයවලුන් අහලපහල ගෙදරක පැවැත්වෙන තොවිලයක බෙර හඩක් ඇසෙන විට ආවේශ වන සැටි අප කුඩා කල දැක තිබේ. තොවිලය කරන්නේ වෙනත් ආතුරයෙකු වෙනුවෙනි. එහෙත් ඉන් ආවේශ වන්නේ, තොවිලයට සම්බන්ධයක් නැති අල්ලපු ගෙදරක වෙනත් කෙනෙකි.

යුද්ධයේ ජයග්‍රහණය විසින් උතුරු නැගෙනහිරට වෙනස් ආකාරයකින් දකුණේ සමාජය ආතුර කරනු ,ලැබ තිබේ. පාර තොටේ යන එනකොට එය අපට නොපෙනේ. දකුණේ සෑම නගරයක්ම ගම්නියම්ගමක්ම බැලු බැල්මට සාමාන්‍ය යි. එහෙත් ඈතින් ඇසෙන බෙර හඬකින් ආවේශ විය හැකි ආතතියකින් මේ

*ඉතිං ආගමික/ජාතික ආතතියට ප්‍රතිකාර කිරීමටත් බෙරකරුවන් නිහඬ කිරීමටත් මර්දනය සම්බන්ධයෙන් ඒ සා විරු විකුම් පෑ ජනාධිපතිවරයෙකුට විරුද්ධ පක්ෂයක සහාය අවශ්‍ය කරන්නේ ඇයි? උත්තරය ඉතා සරළ ය. මෙය එනම් ආගමික/ජාතික ආතතිය මර්දනය කළ යුතු දෙයක් වශයෙන් ජනාධිපතිවරයා විශ්වාස නොකරන නිසා ය. තිත්ත ඇත්ත එය යි.*

වැසියන්ගෙන් බහුතරයක් පෙළෙත්. සාමාන්‍ය තත්වයේ දී මතුපිටට නොඑන එම මනෝභාව තොවිලයක් කොට ඇවිස්සිය හැකිය. ඒවා "සිංහල කම" "අපේ කම" "බෞද්ධ කම" සහ "මහ ජාතිය" වැනි මානසික අසමබරතාවන් ය.
"සිංහල කම" "අපේ කම" "බෞද්ධ කම" නරකක් දැ යි කෙනෙකු අසන්නට පිළිවන. නැත මේ සිංහල අපගේ රටයි අප ඉපැදෙන මැරෙන රටයි යනුවෙන් නන්දා මාලිනී ගායනා කරන කාලයේ එහි වරදක් නොතිබුණි. එවැනි දේශාභිමානී ගී සෑම ජාතියක්ම ගයති. (දේශාභිමානය ගැන ලේඛකයාගේ සාරාර්ථ අදහස් මීට වෙනස් බව මේ කියන කාරණායට අදාළ කර නොගැනේ. එබැවින් ඒ ගැන මෙහි දී සඳහන් නොකරමි). එදා මේ ඊලාමය අපගේ රටයි අප ඉපැදෙන මැරෙන රටයි යනුවෙන් දෙමළෙන් ගායනා කළත් එය වරදකැ යි සිංහලයා නොසිතනු ඇත. මන්ද යත්, එදා සිංහල කම හෝ දෙමළ කම විසින් ආතුරයෙකු බිහි කරනු ලැබ නොතිබුණු බැවිනි. "අපේ කම" අහිංසක පරමාර්ථ සඳහා මෙන්ම විනාශකාරී පරමාර්ථ සඳහා ද යොදාගැනේ. එය තීරණය කෙරෙන්නේ යුගයේ ස්වභාවය අනුවයි.

ඉතිං 70,000 කට අධික දෙමළ සිවිල් වැසියන් පිරිසක් සති කිහිපයක් වැනි කෙටි කාලයක් තුළ ඝාතනය වී ඇතැ යි කියන තවමත් ලක්ෂ ගණනක් නොවේ නම් දස දහස් ගණනක්වත් අවතැන්ව සිටින යුද්ධයක ජයග්‍ර හණයකින් පසු සිංහල කම නමැති කුටුම්භ සංකල්පය අන්තරයාකර වෙනසකට භාජනය කෙරෙමින් ඇති බව අප වටහාගත යුතුව තිබේ. පාරට බස්සන සිංහල කම ඒ තත්ත්වය තුළ මොන විදිහකින්වත් අහිංසක වීමට ඉඩක් නැත. සෑම විනාශයකම අගතීන් ඒ තුළ කෙටී ඇත්තේය.

ඉතිං මුලින්ම කළ යුතුව ඇත්තේ අර තොවිලය නතර කොට බෙර හඬ නිශ්ශබ්ද කිරීම යි. එහෙත් එපමණකින් තොවිලයට නිමිත්ත වූ ගෙදර ආතුරයාව නිරෝගී වන්නේවත් මේ බෙර හඬින් ආවේශ වූ අල්ලපු ගෙදර තැනැත්තාගේ ආතතිය දුරු වන්නේවත් නැත. ඒ සඳහා දියුණු ප්‍රතිකාර වට්ටෝරුවක් අවශ්‍ය කෙරේ. එවැනි ප්‍රතිකාරයක එක කොටසක් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් වාර්තාවේ ඇතුළත් ය. එය සුද්දාගේ හෝ අධිරාජ්‍යවාදී හොර දොස්තරෙකුගේ ප්‍රතිකාරයක් නොවේ. අපේම වන, දේශීය ප්‍රතිකාරයකි. මේ තොවිලය නතර කොට විද්‍යානුකූල ප්‍රතිකාරය නියම කළ හැකි වෛද්‍යවරයා කවුද? ඒ වෙන කිසිවෙකු නොව ජනාධිපතිවරයා ය. එසේ තිබිය දී එම වෛද්‍යවරයා කරන්නේ තමන්ගේ නිවෙසට අර බෙරකාරයන්ව ගෙන්වා බෙරේ ටිකක් හෙමින් ගහන්නැ යි ඔවුන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීම යි.

අද අප මුහුණදෙන භයානක අනතුරේ මූලය ඇත්තේ වෙන කොතැනකවත් නොව එතැනයි. එය අනුන්ගේ මත ද ඉවසන ප්‍රජාතන්ත්‍රවාදී පාලකයෙකුගේ ගති ලක්ෂණයක් ද? හොඳයි අපි එහෙනම් ඒ පැත්තත් සළකා බලමු.

ලෝකයේ තිබුණා යැයි කියූ භයානකම ත්‍රස්තවාදී ව්‍යාපාරය ආණ්ඩුව අතුගා දැම්මේය. එහි දී විරුද්ධ පක්ෂයේ අදහස් හෝ ජාත්‍යන්තරයේ මතය ආණ්ඩුව භාරගත්තේ නැත. ඊළඟට අර්ධ ඒකාධිපති ව්‍යවස්ථාව අවම හානියක රඳවා ගතහැකිව තිබූ 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය කටුගා ජනාධිපතිවරයාව ව්‍යවස්ථාපිත ඒකාධිපතියෙකු කෙරෙන 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය ස්ථාපිත කරගත්තේය. විරුද්ධ පක්ෂයේ අදහසක් එහි දී අහලකටවත් මායිම් කෙරුණේ නැත. ඊළඟට, ප්‍රජාතන්ත්‍රවාදයේ අවසාන මුරගෙය වශයෙන් පැවති අධිකරණයේ ස්වාධීනත්වය වළලමින් හිටපු (සහ තවමත් සිටින) අගවිනිසුරුවරියට නීති විරෝධී ආකාරයෙන් අධිකරණයේ දොරටුව වැසුවා පමණක් නොව දේශපාලනික ගැතිකම් ඕනෑවටත් වඩා ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කරමින් සිටි පුද්ගලයෙකුව නීති විරෝධී ආකාරයෙන් එම පුටුවේ වාඩි කැරැවුණි. එදා මේ රටේ ශිෂ්ට සම්පන්න සමාජයත් ජාත්‍යන්තරයත් සිටියේ අධිකරණයේ ගේට්ටුවට පිටතිනි. මේ කිසි ක්‍රියාවක් ප(ජාතන්ත්‍රවාදී ආකාරයකින් ආණ්ඩුව ජයග්‍රහණය කෙළේ යැයි කිව නොහැකි ය. ඒ සියල්ල කෙළේ, බලය පෙරදැරිව ජනාධිපතිවරයා ගත් තනි තීරණයක් පාර්ලිමේන්තුවේ රූකඩ නියෝජනය හරහා බලහත්කාරීව නීතිගත කොට, සමාජගත කරමිනි.

ඉතිං ආගමික/ජාතික ආතතියට ප්‍රතිකාර කිරීමටත් බෙරකරුවන් නිහඬ කිරීමටත් මර්දනය සම්බන්ධයෙන් ඒ සා විරු විකුම් පෑ ජනාධිපතිවරයෙකුට විරුද්ධ පක්ෂයක සහාය අවශ්‍ය කරන්නේ ඇයි? උත්තරය ඉතා සරළ ය. මෙය එනම් ආගමික/ජාතික ආතතිය මර්දනය කළ යුතු දෙයක් වශයෙන් ජනාධිපතිවරයා විශ්වාස නොකරන නිසා ය. තිත්ත ඇත්ත එය යි.

තමාට අවශ්‍ය කරන දේ හැරෙන තැපෑලෙන් අත්පත් කර ගැනීමටත් තමාට අවශ්‍ය නොකරන දේ සිදු නොවන තැනට වගබලා ගැනීම සඳහා හොරගල් ඇහිලීමටත් ශූර නායකයෙකුගේ මනා පැතිකඩක් මේ ආශ්‍රයෙන් අප ඉදිරියේ චිත්‍රණය කෙරේ.

පරම්පරා දෙකක් තිස්සේ ජාතික අගතියේ දේශපාලනයකින් අත්කරගත් විනාශය එහි එක් පාර්ශ්වයක් පරදා අනිත් පාර්ශ්වය අත්කරගත් හමුදාමය ජයග්‍රහණයකින් සමනය වන්නේ නැත. එසේ තිබිය දී ආගමික අන්තවාදයකුත් ඊට එක් වීම ඉන්ටවල් එකකින් තොරවම විනාශයේ ඊළඟ වටයට අතවැනීමකි. එය ඉවසන සහ ඊට අනුබල දෙන රාජ්‍ය නායකයන් සිටින රටකට අප ඉල්ලා සිටින්නේ මොන දෙවියන්ගේ පිහිටක් ද?

**අවරදිග ආවර්ජනා.**
**රාවය.**

## සන්නස Cartoon by PK




PK ගේ කාටූන් රසවිඳින්නට දිනපතා www.sannasa.net අඩවියට ගොඩවන්න

**සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**
03 8707 4604 / 0402 025 516
**email** sannasanews@gmail.com ads.sannasa@gmail.com